**රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය (G.O.B.A.) ''ලේකම් හා ගණකාධිකාරී'' තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**

1971 අංක 27 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාපිත මෙම සංගමයේ ප්‍රධාන පරිපාලන නිලධාරි වන **''ලේකම් හා ගණකාධිකාරි''** තනතුර සඳහා සුදුසුකම් සහිත රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *සුදුසුකම්* :

   1.1 ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ හෝ, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III නිලධාරියෙකු වීම හෝ, ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ නිලධාරියෙකු වීම හෝ,

   1.2 කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි පන්තියේ නිලධාරියෙකු වීම හෝ පළමු වන පන්තියේ නිලධාරියෙකු වීම වසර 05ක පළපුරුද්ද සහිත ව්‍යාපාර කළමනාකරණ/වානිජ්‍ය විද්‍යා උපාධිය හෝ සමාන සුදුසුකම් සහිත වීම.

2. රාජ්‍ය සේවා හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති 142 සමඟ කියවිය යුතු 143 වන රීතිය අනුව හා (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි හෝ) අයදුම්කරු ද්වීතීයන පදනම යටතේ සංගමයේ සේවයට වර්ෂ 2ක කාලයක් සඳහා මුදා හැරිය හැකි බවට සේවා ප්‍රධානී හෝ පත්වීම් බලධාරි හෝ දෙපාර්තමේන්තු ප්‍රධානීයාගේ (සංවෘත සේවා) ලිඛිත එකඟතාවය අනිවාර්යයෙන්ම නිලධාරියාගේ ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය. ඊට අතිරේකව 143 රීතියේ සඳහන් පරිශිෂ්ඨ 11 සම්පූර්ණ කර ඉදිරිපත් කර තිබිය යුතුය.

3. *තනතුරට හිමි ප්‍රතිලාභ* :

   3.1 රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේදී ලබාගත් සම්පූර්ණ වැටුප නොඅඩුව

   3.2 ප්‍රවාහන දීමනා හැර තනතුරට හිමි දීමනා

   3.3 තනතුරට නියමිත වැටුප් ක්‍රමයේ උපයාගෙන ඇති/පිහිටුවා ඇති මූලික වැටුපෙන් 35%හෝ ඊට වැඩි අතිරේක දීමනාවක්

   3.4 රාජ්‍ය සේවයේ හිමි නිවාඩු වලින් ලබානොගත් නිවාඩු සඳහා ඊළඟ වර්ෂය ආරම්භයේදී දීමනා.

   3.5 මහා සභාවේ එකඟතාවය මත එක් ලිත් මසක වැටුපට සමාන ප්‍රසාද දීමනා (වෙනස් විය හැක.)

   (කරුණාකර රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින් නොවන පුද්ගලයන් අයදුම් කිරීමෙන් වළකින්න.)

4. *පොදු කොන්දේසි* :

   4.1 කොළඹ නගරයට සැතපුම් 35ක් තුළ ස්ථිර පදිංචිය.

   4.2 2021.04.16 දිනට වයස අවු. 50 නොවැඩි වීම.

   4.3 රාජ්‍ය සේවයේ අවු. 15කට නොඅඩු සේවා කාලයක්.

   4.4 ගිණුම් කටයුතු පිළිබඳ වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.

   4.5 පරිගණක සාක්ෂරතාවය හා Internet හා E-mail භාවිතා කිරීමේ හැකියාව

   4.6 සිංහල භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව.

   2021 මැයි මස 17 වැනි දින මධ්‍යහ්න 12.00ට පෙර ලැබෙන සේ ඔබ විසින් සකස් කර ගත් ඉල්ලුම් පත්‍රයක් දෙපාර්තමේන්තු ප්‍රධානි මගින් (ඉහත 2 අනුව නිදහස් කළ හැකි බවට සහතික කර) පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

එන්. එම් විජේරත්න,
සභාපති.

2021 මාර්තු මස 30 වැනි දින,
රජයේ නිලධාරින්ගේ යහසාධක සංගමය,
අංක 65/1, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02
දුරකතන අංක : 011-2434598, 2473633